Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# විෂය නිර්දේශය

(පළමුවන ප්‍රධාන අවධිය සඳහා)

# ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

## පළමුවන ශ්‍රේණිය

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

# විෂය නිර්දේශය

## ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි - පළමුවන ශ්‍රේණිය

## 1.0 හැඳින්වීම

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පළමුවන ශ්‍රේණියේ සිට ම සන්නිවේදනය හා අවබෝධය සඳහා ඉංග්‍රීසි භාවිත කිරීමට දිවයිනේ සියලු ම සිසුන්ට සම අවස්ථා ලබා දීම සඳහා කටයුතු සලසා ඇත. තුන්වන ශ්‍රේණියේ දී විධිමත් ඉංග්‍රීසි ඉගැන්වීම ආරම්භ කිරීමට ප්‍රථම හඳුන්වා දෙන මෙම නව අංගය $ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි` ලෙස හැඳින්වේ. මෙම නාමයෙන් පිළිබිඹු වන පරිදි ම මෙහි දී අවධානය යොමු වනුයේ සිසුන් ක්‍රියාකාරකම් හෝ සෙල්ලම්වල යෙදී සිටින අවස්ථාවල දී කතා බහ සඳහා ඉංග්‍රීසි භාවිතයයි. විශේෂඥ ගුරුවරයෙකු යොදා විධිමත් ආකාරයට ඉංග්‍රීසි ඉගැන්වීමක් මෙහි දී අපේක්ෂා නොකෙරේ.

මෙම විෂය නිර්දේශය ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව මගින් විශේෂයෙන් ම පළමුවන ශ්‍රේණියේ උගන්වන ගුරුවරයා විසින් ඉගැන්විය හැකි ආකාරයෙන් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය යන විෂයයන් උගන්වන අවස්ථාවල දී ඒ හා සමග කළ හැකි ආකාරයට සකස් කර ඇත. මෙම වැඩ සටහන මගින් ශ්‍රවණය හා කථනය සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. මෙම නවාංගය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය සඳහා මෙතෙක් හඳුන්වා දුන් අතර ගණිත විෂයය තුළ ද භාවිත කිරීමට 2007 සිට ඉඩ සලසා ඇත.

පහත සඳහන් ප්‍රධාන අරමුණු මෙම වැඩ සටහන තුළින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- එදිනෙදා ජීවිතයේ දී අවශ්‍ය වන සරල ඉංග්‍රීසි වචන කිහිපයක් නිතර නිතර අසන්නට හා කියන්නට සලස්වා කුඩා වයසේ සිට ම දරුවන් ඉංග්‍රීසි වචනවලට හුරු කිරීම.
- සන්නිවේදනය හා අවබෝධය සඳහා සරල ඉංග්‍රීසි භාවිත වන ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය හා ඉන් පිටත ඇති කිරීම.
- ඉංග්‍රීසි භාවිතයට සිසුන් තුළ ඇති පසුබටතාව මඟ හැරවීම.
- තුන්වන ශ්‍රේණියේ සිට විධිමත් ලෙස ඉංග්‍රීසි ඉගෙනීමට ආසාවක් සිසුන් තුළ ඇති වන පරිදි පසුබිම සකස් කිරීම.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

- සිසුන්ට කතා බහ සඳහා සරල ඉංග්‍රීසි භාවිතය හඳුන්වා දිය යුත්තේ පන්ති භාර ගුරුවරයා විසිනි.
- මේ සඳහා විශේෂ කාල පරිච්ඡේද වෙන් කිරීම ද අවශ්‍ය නොවේ.
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා අවස්ථා මතු කර ගත යුත්තේ සිසුන් $පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය යන ` විෂයයන්ට සම්බන්ධ ක්‍රියාකාරකම් හා විනෝදජනක වැඩවල යෙදී සිටින අවස්ථාවල දීය.
- ක්‍රියාකාරකම්වල යෙදෙමින්, තම මව්බසෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන අවස්ථාවන්හි දී සිසුනට නිතර දක්නට ලැබෙන ද්‍රව්‍යවල නම් ඉංග්‍රීසි භාෂාවෙන් සහ සරල ඉංග්‍රීසි ක්‍රියා පද, විධාන යනාදිය හඳුන්වා දීමටත් හැකි අවස්ථා ආයාසයකින් තොරව මතු කර ගැනීමට උත්සාහ කළ යුතු ය.
- සිසුන් සමඟ නිදහසේ හැසිරෙන විට දී ඔවුනට ඉංග්‍රීසි භාෂාවෙන් ආමන්ත්‍රණය කිරීම, සුබ පැතීම, ආශිර්වාද කිරීම වැනි දේ සිදු කිරීමට අවස්ථා ද මතු වේ. මෙවැනි අවස්ථා සරල වාචික ඉංග්‍රීසි හඳුන්වා දීම සඳහා උපයෝගී කර ගත හැකි ය.
- ගුරුවරයාගෙන් විශේෂයෙන් බලාපොරොත්තු වනුයේ, දරුවා ජීවත් වන වටාපිටාවට සමීප නිතර දක්නට ලැබෙන ද්‍රව්‍ය, ක්‍රියාපද, ආමන්ත්‍රණ, විධාන, ආශිර්වාද යනාදිය ඇතුළත් සරල ඉංග්‍රීසි වාග්මාලාවක් තෝරා ගෙන එම වාග්මාලාව ගුරුවරයාටත් දරුවන්ටත් අමතර බරක් නොවන පරිදි ප්‍රිය ජනක ලෙස ඔවුනොවුන් අතර සන්නිවේදන අවස්ථා ගොඩ නැගීමට උචිත පරිදි යොදා ගැනීමයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- උදාහරණයක් වශයෙන් සැලකිය හැකි සරල ඉංග්‍රීසි වාග්මාලාවක් මෙහි අවසානයේ ඇතුළත් කර ඇත. එහි, එදිනෙදා ජීවිතයේ දී සිසුන්ට නිතර හමු වන ද්‍රව්‍යවල ඉංග්‍රීසි යෙදුම් ද විවිධ අවස්ථා සඳහා උචිත සරල ක්‍රියාපද, ආමන්ත්‍රණ, විධාන ආදිය ඇතුළත් වේ. සිසුන්ට සමීප පරිසරය අනුව මෙම වාග්මාලාව, වචන අලුතෙන් එකතු කිරීමෙන් හෝ අඩු කිරීමෙන්, සුදුසු පරිදි වෙනස් කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත. මෙහි ඉදිරිපත් කර ඇති පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය විෂයයන්ට අදාළ හඳුන්වා දී ඇති වචන සියල්ල ම භාවිත කිරීම අනිවාර්ය නොවේ.
- මීට අමතර ව 2007 වර්ෂයේ සිට ගණිත විෂයයට අදාළ ව ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා වන වාග්මාලාවක් ද පිටු අංක 129 හි ඉදිරිපත් කර ඇත. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය මෙන් ම ගණිතය විෂය ඉගැන්වීමේ දී ද උචිත අවස්ථාවල දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිත කිරීමට අවස්ථාව සැලැස්වීම ගුරුවරයාගේ වගකීමයි.
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා විශේෂයෙන් සකසන ලද මොඩියුලයක් ඇත. පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ තේමාවන්ට අනුව කාණ්ඩ කර ඇති වාග්මාලාවක් ද යෝජිත ක්‍රියාකාරකම් තවත් උපදෙස් හා උදවු ද එහි ඇතුළත් කර ඇත. ඉංග්‍රීසි භාෂාවෙන් සකසා ඇති මෙම මොඩියුල ගුරුවරයාගේ කාර්ය භාරය පහසු කර ලීමට සමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- නිවැරදි උච්චාරණය සඳහා මග පෙන්වීමක් ලෙසත්, නිවැරදි රිද්මය හා ගායනා කිරීමේ උපකාරකයක් ලෙසත් ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව මගින් සකසා ඇති 1 වන හා 2 වන ශ්‍රේණි සඳහා වන සිංදු ඇතුළත් කැසට් පටයක් සකස් කර ඇති අතර එක් එක් තේමාව සඳහා ඇති සිංදු පන්තියේ දී ගායනා කිරීම සඳහා මෙම කැසට් පටය උපයෝගී කර ගැනීම ගුරුවරයාට පහසුවක් වනු ඇත.
- ගුරුවරයාට එදිනෙදා භාවිත කළ හැකි පන්ති කාමර යෙදුම් පිටු අංක 128හි ඇතුළත් කර ඇත.
- නිවැරදි ව ඉංග්‍රීසි වචන උච්චාරණය කිරීම පිළිබඳ ව සැලකිලිමත් වන්න. අවශ්‍ය වේ නම් මේ සඳහා පාසලේ ඉංග්‍රීසි උගන්වන ගුරුවරුන්ගේ සහ ඉංග්‍රීසි ගුරු උපදේශකවරුන්ගේ උපදෙස් ලබා ගත හැකි ය. එමෙන් ම, ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවල (Regional English Support Centres) සේවය ද ලබා ගෙන ගුරුවරයාගේ ඉංග්‍රීසි දැනුම වර්ධනයට ද මේ තුළින් අවස්ථා සලසා ගැනීම අපේක්ෂා කෙරේ.

## විශේෂයෙන් සැලකිය යුතු කරුණු කිහිපයක්

- වාචික ඉංග්‍රීසි හඳුන්වා දීමේ ක්‍රියාවලිය යටතේ

    - ♦ විධිමත් ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රම භාවිතය අපේක්ෂා නොකෙරේ.
    - ♦ ඉංග්‍රීසි හෝඩියේ අකුරු ඉගැන්වීමට, ඉංග්‍රීසි වචන ලිවීමට ඉගැන්වීම හෝ කියවීම අපේක්ෂා නොකෙරේ.
    - ♦ විශේෂ පොත්පත් භාවිතය අවශ්‍ය නොවේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.